ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## INS ශල්කි සබ්මැරීනය කොළඹට පැමිණේ

ඉන්දියානු නාවික හමුදාවේ INS ශල්කි සබ්මැරීනය 2024 අගෝස්තු 02 වන දින දෙදින සංචාරයක් සඳහා කොළඹට පැමිණියේය. ශ්‍රී ලංකා නාවික හමුදා බලකායේ නිලධාරියා විසින් සබ්මැරීනය උත්සවාකාරයෙන් පිළිගන්නා ලදී.

2. සබ්මැරීනයේ අණදෙන නිලධාරිතුමා 2024 අගෝස්තු 02 වන දින බටහිර නාවික මූලස්ථානයේදී බටහිර නාවික ප්‍රදේශය භාර අණදෙන නිලධාරී රියර් අද්මිරාල් ඩබ්. ඩී. සී. යූ. කුමාරසිංහ මහතා හමු වීමට නියමිතය. එදිනම, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නම් කරන ලද සාමාජිකයන් පනස් දෙනෙකු පමණ සබ්මැරීනය නැරඹීමට එක් වනු ඇති අතර ඔවුන් සබ්මැරීනය පිළිබඳ දැනුවත් කරනු ඇත. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් ද ශ්‍රී ලංකා ආරක්ෂක බලකායන්ගේ සාමාජිකයන් ද INS ශල්කි සබ්මැරීනය නැරඹීමට එක් වනු ඇත.

3. ශිෂුමාර් පන්තියේ ඩීසල්-විදුලි සබ්මැරීනයක් වන INS ශල්කි සබ්මැරීනය 1992 පෙබරවාරි 7 වන දින ඉන්දීය නාවික හමුදාවට එක් කරන ලදී. ඉන්දියාව විසින් නිෂ්පාදනය කරන ලද පළමු සබ්මැරීනය මෙයයි. මෙයට පෙර කල්වේරි පන්තියේ සබ්මැරීනයක් වන INS කරාජ් සබ්මැරීනය 2024 පෙබරවාරි මාසයේ ද INS වාගීර් සබ්මැරීනය ජාත්‍යන්තර යෝගා දිනයට සමගාමීව 2023 ජූනි මාසයේ ද කොළඹට පැමිණියේය.

4. මෙම සංචාරය අතරතුර දී සබ්මැරීනය ඉන්ධන සහ අවශ්‍ය අනෙකුත් ද්‍රව්‍ය ලබා ගනු ඇත. නෞකා කාර්ය මණ්ඩලයට විවේකයක් ලබා ගැනීමට ද ශ්‍රී ලංකාවේ විශේෂ ස්ථාන දැක බලා ගැනීමට ද අවස්ථාව හිමි යනු ඇත. සබ්මැරීනය 2024 අගෝස්තු 04 වන දින දිවයිනෙන් පිටත්ව යනු ඇත.

****

*කොළඹ*
*2024 අගෝස්තු 02*